## කැලෑ දෙපාර්තමේන්තු අරමුදල - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට කැලෑ දෙපාර්තමේන්තු අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

##### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** වන අපරාධ නඩු අවසන් වී අදාළ දඩ මුදල් අධිකරණ මගින් කැලෑ අරමුදලට ගෙවා තිබුණත්, වර්ෂය අවසානයේදී නිලධාරීන්ට ගෙවිය යුතුව තිබෙන ත්‍යාග මුදල් ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

**(ආ)** 2012 වර්ෂය සඳහා ලැබිය යුතු උසාවි දඩ මුදල් වශයෙන් රු. 1,687,627 ක් මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණත්, 2013 වර්ෂයේ මුල් මාස 04 දී පමණක් 2012 වර්ෂය වෙනුවෙන් රැස්කල උසාවි දඩ මුදල රු. 4,025,328 ක් වී තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු දඩමුදල් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

**(ඇ)** උසාවි දෙකක් විසින් අය කර ගෙන තිබුණත් 2012 දෙසැම්බර් 31 දිනට අරමුදල වෙත එවා නොතිබුණු රු. 54,750 ක හිඟ ආදායම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

### 2. මූල්‍ය සමාලෝචනය

#### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු. 14,946,455 ක අතිරික්තයක් වු අතර , ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.22,454,897 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.7,508,442 ක හෙවත් සියයට 33 ක අඩු වීමක් පෙන්නුම් කෙරිණි. අධිකරණ දඩ මුදල් රු. 3,108,690 කින් හෙවත් සියයට 11.13 කින් අඩුවී තිබීම සහ තෑගි ප්‍රදාන රු. 2,209,176 කින් හා ආරක්ෂක වියදම් රු. 2,848,594 කින් වැඩිවීම නිසා සමස්ත ගෙවීම් සියයට 72 කින් වැඩිවී තිබීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සඳහා අධිකරණ දඩ මුදල් වශයෙන් රු. 25,925,192 ක් ලැබී තිබුණු අතර ඉන් රු. 23,000 ක් ආපසු ගෙවා තිබුණි. 2012 වර්ෂයේදී 2011 වර්ෂය වෙනුවෙන් ලැබුණු රු. 1,078,151 ක මුදල හා 2012 වර්ෂය සඳහා ලැබිය යුතු රු. 1,687,627 ක මුදල ගැලපීමෙන් පසු සමාලෝචිත වර්ෂය සඳහා ලැබුණු දඩ මුදල රු. 26,511,668 ක් විය. එය 2011 වර්ෂයට සාපේක්ෂව සියයට 1 ක වර්ධනයකි. ඉහත 2.2.1 (ආ) ඡේදයේ සඳහන් කරුණු අනුව මෙකී වර්ධනයද වෙනස් වන බව පෙන්වා දිය හැක.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ)** උසාවි මඟින් අයකරගත් දඩ මුදල් කැලෑ අරමුදලට බැර කිරීමට ප්‍රමාදවීමක් සිදුවී තිබු අතර, වර්ෂය තුල එක් එක් මාසය සඳහා ලැබිය යුතු උසාවි දඩ මුදල් ආදායම් නිවැරදිව හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාවලියක් අනුගමනය කර නොතිබුණි.

**(ආ)** වන අපරාධ නඩු අවසන්ව තිබුණත් එම වන අපරාධ වැළැක්වීම සඳහා දායකවූ නිලධාරීන් විසින් ත්‍යාග මුදල් ඉල්ලුම් කිරීමේ හා ඉල්ලුම් කළ ත්‍යාග මුදල් ලබාදීමේ ප්‍රමාදයන් වැළැක්වීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

එක් එක් මාසය අවසානයේ වන අපරාධ සම්බන්ධයෙන් අධිකරණ වලදී විසඳී ඇති නඩු වලට අදාළව තෑගි අරමුදලට බැර විය යුතු ආදායම් සම්බන්ධ තොරතුරු කලාප කාර්යාල වලින් ලබා නොගෙන අධිකරණ 23 කින් සෘජුවම ලබා ගත් හිඟ ආදායම් පිළිබඳ වාර්ෂික වාර්තා පදනම් කර ගෙන ලැබිය යුතු උසාවි දඩ මුදල් ගිණුම් ගත කර තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

2012 වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ත්‍යාග අරමුදලේ වෙනත් වියදම් හා උසාවි ගමන් වියදම් සඳහා අයවැය ලේඛනය මගින් සලසා තිබුණු ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු ඉතිරිය, ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 31 ක් හා සියයට 89 ක් වී තිබුණි. එම ඉතිරියන් සිදු වී තිබුණේ ක්‍රමානුකූල වැය පාලනය කිරීමෙන් නිසා බව හේතු වශයෙන් දක්වා තිබුණි. නීතිය ක්‍රියාත්මක කිරීමෙහි යෙදී සිටින වන නිලධාරීන්ගේ කාර්ය ඇගයීම සඳහා ප්‍රතිලාභ ලබා දීමට පිහිටුවා ඇති අරමුදලෙන්, වන අපරාධ වැළැක්වීමේ කටයුතු සඳහා දරනු ලබන වියදම් පාලනයක් සිදු කළ නොහැකි බවත් , එසේ වියදම් පාලනයක් සිදු කළහොත් අරමුදලේ අපේක්ෂිත අරමුණු කරා ළඟාවිය නොහැකි බවත් අවධාරණය කරනු ලැබේ. යථෝක්ත විචලනයන් හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.3 අභ්‍යන්තර විගණනය

2012 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන වැඩ සටහන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වන සංරක්ෂක ජනරාල් වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම එකතු කිරීම
(ඇ) මුදල් බැංකුගත කිරීම